## බීමතින් සිසුසැරිය පැදවූ රියදුරා අත්අඩංගුවට

ඉහත මාතෘකාව යටතේ අද දින ( 2025.05.19 ) සමාජ මාධ්‍ය ජාලා වල සැරිසරන ලද පුවත සම්බන්ධවයි.

කටුපොත , කනෝගම, කොස්දෙණිය , මාවිඇල හරහා මගුලාගම මහ විද්‍යාලය සහ මූණමල්දෙණිය සිට මොරගනේ , කටුපොත ප්‍රාථමික විද්‍යාලය දක්වා පාසැල් සිසුන් ප්‍රවාහනය කිරීමට HW - 5876 අංක දරණ බස්රථයට වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නිර්දේශය මත ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් සිසුසැරිය ව්‍යාපෘතිය යටතේ ගිවිසුම්ගත වී ඇත.

කටුපොත , රදලියගොඩ ලිපිනයෙහි පදිංචි එච්.ඒ. පී. පී. හෙට්ටිආරච්චි මහත්මිය සමග 2024 දෙසැම්බර් 17 දින සිට ඉදිරි වසර තුනක් දක්වා වලංගු වන පරිදි මෙම ගිවිසුම්ගතවීම සිදුකර ඇත.

2025.05.19 දින මෙම බස්රථය පාසැල් සිසුන් සහිතව ධාවනය කිරීමේදී අදාළ බස්රථයේ රියදුරු බීමතින් සිටි බවට සමාජ මාධ්‍යවල සැරිසරන ලද පුවතට අනුව වහාම ක්‍රියාත්මක වූ ජාතික ගමනාගමන කොමිෂන් සභාව සිසුසැරිය පාසැල් සේවාවේ ධාවනය තාවකාලිකව අත්හිටුවන ලද අතර , ඒ ඔස්සේ විමර්ශණයක්ද ආරම්භ කර ඇත.

කටුපොත පොලිස් ස්ථානයෙන් ලබාගන්නා ලද වාර්තාව අනුව මෙම බස්රථයේ රියදුරු 2025.05.27 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

විමර්ශණ කටයුතු අවසන් වන තෙක් මෙම බස්රථයේ ප්‍රවාහන පහසුකම් සලසා ගත් පාසැල් ළමුන්ට අගතියක් නොවන පරිදි වෙනත් බස්රථයකින් මෙම සිසුසැරිය සේවාව ආවරණය කරන ලෙසට වයඹ පළාත් ප්‍රවාහන අධිකාරියට දැනුම් දී ඇත.

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව